**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# බැංකු පරීක්ෂක (සාමාන්‍ය)

## බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ බැංකු පරීක්ෂක තනතුර (සාමාන්‍ය) සඳහා ඉහළ අභිප්‍රේරණයක් සහිත වෘත්තිකයින්ගෙන් අයදුම්පත් කැඳවයි.



### 1.0 කාර්යය/වගකීම් :

- 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත සහ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කිරීම සහ බලපත්‍රලාභී බැංකු අදාළ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර පිළියම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.
- බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී ඉදිරිපත් කරන ලද නිර්දේශ කඩිනමින් සහ නිවැරදිව ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීම සඳහා පරීක්ෂකවරුන් සහ බලපත්‍රලාභී බැංකුවල අධීක්ෂකවරුන් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- බලපත්‍රලාභී බැංකු අදාළ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා සහ හඳුනාගනු ලබන කිසියම් අක්‍රමිකතාවක් හෝ මතුවෙමින් පවතින අවදානම් සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගැනීම සඳහා පවරා ඇති බැංකුවල විශේෂිත/ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම.
- 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) මෙන්ම ඊට අදාළ රෙගුලාසි සමාලෝචනය කර, ජාත්‍යන්තරව පිළිගත් යහ භාවිතයන් සහ දේශීය වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූලව අවශ්‍ය වන සංශෝධන සකස් කිරීම සහ බැංකු ක්ෂේත්‍රයේ නෛතික රාමුව ශක්තිමත් කිරීම සහ එම ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා අදාළ නියෝග නිකුත් කිරීම.
- අදාළ බලපත්‍රලාභී බැංකු නියාමන අවශ්‍යතා සහ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට දායක වීම සඳහා එම බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම.
- අදාළ බැංකු සහ පාර්ශ්ව වෙතින් ඉදිරිපත් කරනු ලබන නියාමන අනුමැතිය සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කරමින්, සියලුම ඉල්ලීම් සහ ගැටලු සඳහා කාලෝචිතව, නිවැරදිව සහ අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූලව ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම.
- පරීක්ෂණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ විකාසනය වෙමින් පවතින අවදානම්වලට අනුවර්තනය වීම සඳහා නියාමන මාර්ගෝපදේශවල සිදුවන වෙනස්කම්, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රවණතා සහ මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් පිළිබඳව නිරන්තරයෙන් යාවත්කාලීන වී සිටීම.
- නියාමන අධීක්ෂණය වැඩිදියුණු කිරීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ අනුකූලතාව සහතික කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුළ ක්‍රමයෙන් වර්ධනය වන අධීක්ෂණ තාක්ෂණික (SupTech) ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා දායක වීම.
- බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ විෂය දැනුම පුළුල් කිරීම සඳහා ඔවුන්ගේ කුසලතා වර්ධනයට දායක වීම.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 22වන වගන්තියට අනුව බැංකුවලට අදාළව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් අවදානම් පාදක පරීක්ෂණ, ස්ථානීය පරීක්ෂණ (Spot), ස්ථානීය/ස්ථානීය නොවන (Onsite/Offsite) පසු විපරම් පරීක්ෂණ සිදු කරමින් අදාළ බැංකු නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම.
- බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වය විසින් පවරනු ලබන ඕනෑම කාර්යයක් සහ වගකීමක් ඉටු කරමින් එම දෙපාර්තමේන්තුවේ සමස්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීම.

ඉහත සඳහන් කර ඇත්තේ මෙම තනතුරට අදාළ ප්‍රධාන රාජකාරි සහ වගකීම් වන අතර ඒවා ඉහත ලැයිස්තුවට පමණක් සීමා නොවේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව, අවශ්‍යතාව පරිදි තෝරාගනු ලබන අපේක්ෂකයා වෙත අමතර රාජකාරි සහ වගකීම් පවරනු ලැබිය හැකිය.

### 2.0 අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද :

#### 2.1 අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :

- අවම වශයෙන් දෙවන පන්තිය (ඉහළ පෙළ) සාමාර්ථයක් හෝ උපරිම 4.0ක් වන ශ්‍රේණි ලකුණු සාමාන්‍යයෙන් (GPA) 3.5ක ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් හෝ අවම වශයෙන් 75%ක බර තැබූ සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් සහිත ව, ගිණුම්කරණය, බැංකුකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ හෝ සංඛ්‍යානය පිළිබඳ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් විශේෂවේදී ප්‍රථම උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර තුනක (03)) ලබා තිබීම

  හෝ

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත්, ගිණුම්කරණය, බැංකුකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, ගණිතය හෝ ඉංජිනේරුකරණය යන විෂය ක්ෂේත්‍රයක පළමු උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර තුනක (03)) හෝ පශ්චාත් උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර එකක (01)), පහත සඳහන් එක් සුදුසුකමක් සමඟ;
  - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership)
  - එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA – UK) ආශ්‍රිත සාමාජිකත්වය
  - වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) ආශ්‍රිත සාමාජිකත්වය
  - ඇමරිකා එක්සත් ජනපදයේ CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයෙක් වීම (Charter Holder of CFA)
  - ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA – SL) ආශ්‍රිත සාමාජිකත්වය
  - අවදානම් වෘත්තිකයන්ගේ ගෝලීය සංගමය වෙතින් ලබාගත් මූල්‍ය අවදානම් කළමනාකරණය පිළිබඳ සුදුසුකම (FRM)
  - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සමාජිකත්වය (IBSL-SL)

#### 2.2 පළපුරුද්ද :

- ඉහත 2.1 හි සඳහන් අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු ලබාගත්, ගිණුම්කරණය, බැංකුකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ හෝ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයන් ගෙන් ඕනෑම ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද, මූල්‍ය ආයතනයක තනතුරක සේවා පළපුරුද්ද වඩාත් සුදුසු වේ.

### 3.0 අවශ්‍ය කුසලතා / නිපුණතා :

- ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය සඳහා විශ්ලේෂණ කුසලතා
- මූල්‍ය ආයතනවල මෙහෙයුම් සහ ඒ ආශ්‍රිත පද්ධති පිළිබඳ දැනුම
- ණය, තොරතුරු තාක්ෂණ, මෙහෙයුම්මය, වෙළඳපොළ සහ භාණ්ඩාගාර ඇතුළු අවදානම් ඇගැයීම පිළිබඳ දැනුම
- බැංකු මෙහෙයුම් සහ අධීක්ෂණයට අදාළ බැංකු නීති සහ යහ භාවිතයන් හා අනුකූලතා පිළිබඳ මනා අවබෝධය
- පරිගණක සාක්ෂරතාව (විශේෂයෙන් Microsoft Word සහ Excel)
- වාචික සහ ලිඛිත සන්නිවේදන/ඉදිරිපත් කිරීමේ කුසලතා

### 4.0 වයස් සීමාව :

- 2026.11.15 වනවිට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

### 5.0 සේවා නියුක්තිය :

- තෝරාගනු ලබන සුදුසුකම්ලත් අපේක්ෂකයන් ශ්‍රී ලංකා මහ බැංකු ස්ථිර සේවයේ මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියේ (Staff Class Grade I) නිලධාරීන් ලෙස වසර දෙකක (02) පරිවාස කාලයකට යටත්ව බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. පරිවාස කාලය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔවුන් එම තනතුරේ ස්ථිර කිරීම සඳහා සලකා බලනු ලැබේ.

### 6.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ :

- ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ වැටුප් පරිමාණවලට අනුකූල ආකර්ෂණීය වැටුපක්, සේවක අර්ථසාධක සහ භාරකාර අරමුදල් ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ, සේවක ණය පහසුකම්, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සහ පුහුණු අවස්ථා හිමි වේ.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය

නියමිත අවම සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින් පමණක් වැඩිදුර ඇගයීම් සඳහා කෙටි ලැයිස්තුගත කරනු ලබන අතර, එම ඇගයීම්වලට තාක්ෂණික ඇගයීම් සහ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් ඇතුළත් විය හැකිය.

### අයදුම්පත්

තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති, ශ්‍රී ලාංකික පුරවැසියන් 2026.11.15 වන දින හෝ ඊට පෙර පහත සබැඳිය ඔස්සේ අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

සබැඳිය - ***https://www.cbsl.gov.lk/en/careers***

අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී ඉහත සබැඳියේ දක්වා ඇති නියම සහ කොන්දේසිවලට අනුගත වන ලෙසට අයදුම්කරුවන්ට උපදෙස් ලබා දෙනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට යෝග්‍ය නොවේ. අදාළ සුදුසුකම් සපුරා නොමැති හෝ අවසන් දිනට පසුව ලැබෙන හෝ නියමිත ආකෘතියට යටත් නොවන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඉහත තනතුර සඳහා අදාළ වන සුදුසුකම් සපුරාලීම තහවුරු කිරීම පිණිස අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද තහවුරු කරන ලියකියවිලිවල ස්කෑන් කරන ලද පිටපත් උඩුගත (Upload) කළ යුතුය. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දට අදාළ සහතික පත්‍රවල පිටපත් අමුණා නොමැති ඕනෑම අයදුම්පතක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම පියවරක දී පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඇගයීමට පෙර පැවැත්වෙන සහතික පත්‍ර පරීක්ෂා කිරීමේ වාරයේ දී අදාළ ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු ආකාරයකින් යෝග්‍ය අයදුම්කරුවෙකු ලෙස නොසැලකේ.

ඕනෑම අයුරකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් විය හැකිය. බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම හෝ බඳවා ගැනීම් කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. තනතුරේ අවශ්‍යතා මත පදනම් ව සුදුසුකම් (අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්වලින් ආවරණය වන විෂය ක්ෂේත්‍ර) සහ පළපුරුද්දේ අදාළත්වය තීරණය කිරීම සහ අයදුම්පත් කෙටිලැයිස්තුගත කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිමතය පරිදි සිදු වේ. බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සම්බන්ධ කරගනු ලබන්නේ කෙටිලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණි.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන, තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් සඳහා අදාළ වේ.

**අධ්‍යක්ෂ - මානව සම්පත්**
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දු.ක - 011-2477330 ෆැක්ස් - 011-2477715